# ශාසනික ගුරු-සිසු සබඳතාව පිළිබඳ විමසුමක්

මුවඇටගම ඤාණානන්ද හිමි

ගිහි සමාජයේ පිය පුතු සබඳතාවයට යම්කිසි වැදගත්කමක් හා අගයක් ලැබේ නම් ඒ හා සමානව ම හෝ ඊටත් වැඩි අගයක් පැවිදි සමාජයේ ගුරු ශිෂ්‍ය සම්බන්ධතාවයට හිමිවෙයි. බුදුරජාණන් වහන්සේ තමන්ට ගුරුවරයෙකු නොමැති බව පමණක් නොව තමන්ට සමාන කෙයෙකු පවා ලෝකයේ විද්‍යමාන නොවන බව පැවසූහ.[1] උන්වහන්සේ සමාන වන්නේ තවත් එවැනි ම වූ බුදුරජාණන් වහන්සේ නමකට පමණි. එබැවින් උන්වහන්සේ සම්මා සම්බුද්ධෝ හා අසම සමෝ යනුවෙන් හඳුන්වති. එහෙත් උන්වහන්සේ තමන් අවබෝධ කරගත් ධර්මයට හා බුද්ධත්වය ලබාගැනීම සඳහා තමන්ට උපකාර වූ අස්වත්ථ බෝධියට ගුරුත්වයෙන් සලකා ආචාර කළ බව කියැවේ.[2] මෙසේ කිරීමෙන් උන්වහන්සේ ආචාර්යවරකුගේ ඇති අගය ලෝකයාට පෙන්වා දුන්හ. එසේ ම තමන් තුන් ලොවට ම ගුරුවරයා වන බව බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළහ.[3] පූර්ණ බ්‍රහ්මචාරී ජීවන ප්‍රතිපදාවක් ගතකරන භික්ෂු ශාසනික සම්ප්‍රදාය තුළ ගුරු-සිසු සබඳතාවයට විශේෂ තැනක් හිමිවේ. ඊට හේතුව සමස්ත ශාසනික වැඩ පිළිවෙල ම ක්‍රියාවට නැඟෙන්නේ එම සබඳතාවයේ ප්‍රතිඵලයක් වශයෙන් වීමයි. චුල්ලවග්ගපාළියේ වත්තක්ඛන්ධකයේ ඉදිරිපත් කෙරෙන උපාධ්‍යාය-සද්ධිවිහාරික හා ආචාර්ය-අන්තේවාසික යන වත් හතර මඟින් ආරාමික ජීවිතයේ දී එම ගුරු-සිසු සබඳතාව පවත්වා ගතයුතු ආකාරය විස්තර කර ඇත.[4] මේ කරුණු එම ශාසනික තනතුරු ආරම්භ වීමේ පුවත් දැක්වෙන මහාවග්ගපාළියේ මහාක්ඛන්ධකයේ ද මේ අයුරින් ම ඉදිරිපත්කර ඇත.[5] මේ ලිපියෙන් ගුරුවරයා හා ශිෂ්‍යයා විසින් ක්‍රියාත්මක කළයුතු යැයි දක්වන එම වත් ආරක්ෂා කිරීමෙන් අපේක්ෂිත ගුරු-සිසු සබඳතාවත් ශාසනික අරමුණුත් ඉටුකර ගැනීමට ඒවා කෙතරම් ඉවහල් වන්නේ ද යන බව විමර්ශනය කිරීම සිදුවෙයි.

ආරාමික සංස්ථාව තුළ භික්ෂු සමාජය ස්ථර හතරකින් ව්‍යුහගත වන බව වත්තක්ඛන්ධකයේ ඇතුළත් ඉහතින් නම්කළ 9-12 වත්වලට අනුව පෙන්වා දිය හැකිය. එනම් උපාධ්‍යාය හා සද්ධිවිහාරික යන ගුරු-ශිෂ්‍ය සම්බන්ධතාවයේ ස්තර දෙකත් ආචාර්ය හා අන්තේවාසික යන ගුරු-සිසු සබඳතාවයේ ස්ථර දෙකත් යන ස්ථර හතරයි. මේ මඟින් ශාසනයේ ගොඩනඟා ඇති සබඳතාවයේ ශක්තිමත් පදනම නිසා ම

වසර දෙදහස් පන්සීයයකටත් වඩා දීර්ඝ කාලයක් පුරා ගුරු-ශිෂ්‍ය පරම්පරාගත සම්ප්‍රදාය මත සඟ සසුන පවත්වාගෙන යාමට හැකියාව ලැබී තිබේ.

වත්තක්ඛන්ධකයේ දැක්වෙන මේ ගුරු-සිසු වත් භික්ෂුව විසින් කවර අවස්ථාවේ දී අනුගමනය කළයුතු ද යන්න මුලින් ම නිරාකරණය කරගත යුතුව ඇත. ඊට හේතුව නම් කුල දරුවෙක් සාමණේර පැවිද්ද ලබන අවස්ථාවේ දී මෙන් ම සාමණේර නමක් උපසම්පදාව ලබන අවස්ථාවේ දී ද උපාධ්‍යායන් වහන්සේ නමක් හා ආචාර්යයන් වහන්සේ නමක් පත්කර ගැනීමට අනුදැන තිබීමයි.[6] ඇත්ත වශයෙන් ම මෙයින් ප්‍රකට වන වැදගත් ම කාරණය නම් සංඝ සමාජය සාමණේර හා උපසම්පන්න යනුවෙන් කොටස් දෙකකට බෙදා දක්වන විට දී පවා උපාධ්‍යාය හා සද්ධිවිහාරක, ආචාර්ය හා අන්තේවාසික යන සමාජ ස්ථර හතර ප්‍රකටව දක්නට ලැබීමයි. මෙයින් උපාධ්‍යාය හා ආචාර්ය යන දෙපිරිස ගුරුවරුන්ගේ සංඛ්‍යාවටත් සද්ධිවිහාරික හා අන්තේවාසික යන දෙපිරිස ශිෂ්‍ය ගණයටත් අයත්වේ. එබැවින් සංඝ සමාජය මේ ස්ථර හතර අනුව ගුරු ශිෂ්‍ය වශයෙන් ඉතා පැහැදිලිව කොටස් දෙකකට වෙන්කළ හැකිය. ඒ අනුව සංඝ සමාජයේ ක්‍රියාත්මක වන ගුරු-ශිෂ්‍ය නම්වූ ආචාරාත්මක රාමුව තුළ පිහිටා ඉතාමත් පහසුවෙන් තීරණ ගැනීමට හා ඒවා ක්‍රියාත්මක කිරීමට හැකියාව ඇති බව ද පැහැදිලිය.

උපාධ්‍යාය හා ආචාර්ය වශයෙන් භික්ෂුවකට කටයුතු කළහැකි වන්නේ උපසම්පදාවෙන් පසු එළැඹෙන වැඩිහිටි වයසේ දී බැවින් උන්වහන්සේලාට අයත් වත් ඉටුකිරීම සම්බන්ධයෙන් ගැටලුවක් මතු නොවේ. එහෙත් සද්ධිවිහාරික හා අන්තේවාසික වත් ඉටුකිරීම සම්බන්ධයෙන් තරමක් අපහසුතා ඇතිවිය හැකිය. භික්ෂුවක් විසිවයස් ඉකුත්වූ තරුණ වියේ දී උපසම්පදාව ලබන බැවින් වත්තක්ඛන්ධකයේ දැක්වෙන වත් එවැනි මට්ටමේ අයකු විසින් ක්‍රියාත්මක කිරීමේ බාධාවක් හෝ අපහසුතාවයක් නොමැත. එහෙත් සාමණේර ප්‍රව්‍රජ්‍යාවට කෙනෙකු ළමා අවදියේ ද පත්වන බැවින් ළමා වයසේ සිටින්නකු විසින් එම වත් ක්‍රියාත්මක කිරීමේ දී තරමක ලිහිල් ක්‍රමයක් අනුගමනය කළයුතුව ඇත. සාමණේර ප්‍රව්‍රජ්‍යාව ලබන තැනැත්තා තරුණ වයසේ සිටින අයෙකු නම් වත්තක්ඛන්ධකයේ සඳහන් සද්ධිවිහාරික හා අන්තේවාසික වත් පිළිපැදීමේ අපහසුවක් ඇති නොවේ. තවත් ආකාරයකින් සලකා බලන විට උපාධ්‍යාය වත්,



සද්ධිවිහාරික වත්, ආචාර්ය වත් හා අන්තේවාසික වත් යනුවෙන් දක්වන මේ නියමයන් ඔවුනොවුන් අන්‍යෝන්‍ය වශයෙන් ක්‍රියාකළයුතු ආකාරය පොදුවේ දැක්වීමක් මිස වයස් සීමාවන් හා සුවිශේෂ තත්ත්වයන් සලකා ඉදිරිපත් වූවක් නොවන බව සැලකිය යුතුව තිබේ. එමෙන් ම වර්තමාන සමාජ රටාව තුළ භික්ෂුවකට ක්‍රියා කිරීමට සිදුවී ඇති ආකාරයත් මේ වතාවත් නියමවූ බුද්ධකාලීන භික්ෂුවගේ ජීවන රටාවත් අතර වෙනස්කම් රාශියක් සිදුවී ඇති බව ද මේ නියමයන් ක්‍රියාත්මක කිරීමේ දී අවධානයට ගතයුතුව ඇත.

වර්තමානයේ ප්‍රව්‍රජ්‍යාවට පත්වන බොහෝ කුලදරුවන් වයස 10-15 පරාසයේ වන අතර ඔවුන් බොහෝ විට වයස 22-25 පමණ තෙක් අධ්‍යයන කටයුතුවල නිරන්තරයෙන් යෙදීම අනිවාර්ය වී ඇත. අධ්‍යාපනය සඳහා විශේෂයෙන් විවේකය හා පෞද්ගලික නිදහස අවශ්‍ය බැවින් මේ වත් ඉටු කිරීමේ දී යම් ලිහිල් බවක් අපේක්ෂා කරනු ලැබේ. අනෙක් අතට වර්තමානයේ පිණ්ඩපාතයේ වැඩමවීම අනිවාර්යයෙන් සිදුවන ක්‍රියාදාමයක් නොවන අතර භික්ෂූන් වැඩ සිටින විහාරස්ථාන කරා දානය රැගෙන විත් පූජා කිරීම සිදුවේ. එබැවින් එම වත්වලින් ඉදිරිපත් වන ඇතැම් කොටස් හෝ සම්පූර්ණයෙන් ම හෝ ඊට සමගාමී ආදේශක චර්යාවන් සමඟ සම්බන්ධකර ක්‍රියාත්මක කළයුතුව තිබේ. නිදර්ශනයක් වශයෙන් පිණ්ඩපාත චාරිකාවට අදාළ වත්වලට ආදේශකයක් වශයෙන් දායක පිරිස් විසින් විහාරස්ථානට රැගෙනවිත් පිරිනමන දානය පිළියෙල කරගැනීම, බුද්ධපූජාව පැවැත්වීම, දායක පිරිසට පුණ්‍යානුමෝදනා කිරීම ආදි කටයුතු දෛනිකව සිදුකෙරෙන වත් බවට පත්වී ඇත. ජන්තාඝර වත් සඳහා ස්නානයට අවශ්‍ය පහසුකම් සුදුසු හා අවශ්‍යතාව පරිදි සලසාදීම හා සිවුරු පිරිකර ආදිය පිරිසිදුකර දීම ආදේශ කරගැනීමට ද හැකියාව තිබේ.

භික්ෂු ශාසනය ආරම්භයේ දී ප්‍රව්‍රජ්‍යාව ලබාගැනීමට නියමිත වයයෙහි සීමාවක් පිළිබඳ නිශ්චිත අදහසක් නොවිණි. එහෙත් රාහුල කුමාරයාගේ ප්‍රව්‍රජ්‍යාවෙන් පසුව සුද්ධෝදන මහරජතුමාගේ ඉල්ලීමකට අනුව ප්‍රව්‍රජ්‍යාවට පත්වන කුලදරුවකුට තිබිය යුතු අවම වයස් ප්‍රමාණය පිළිබඳ සීමාව තීරණය කළ බව පෙනේ. එමෙන් ම ප්‍රව්‍රජ්‍යාව ලබන තැනැත්තාගේ කායික හා මානසික නීරෝගීභාවය පිළිබඳව ද සඟ සසුනේ ආරම්භක කාලයට වඩා වැඩි සැලකිල්ලක් පසුකාලයේ දී දැක්වූ බවට විනය ශික්ෂා මඟින් සනාථ වේ.[7] ග්‍රන්ථධුරය වඩාත්



02 OCT 2015

ජනප්‍රියත්වයට පත්වූ යුගයේ දී ප්‍රව්‍රජ්‍යාව ලබන පුද්ගලයාගේ මානසික නීරෝගිභාවය, ශික්ෂණය ලබාගැනීමට දක්වන හැකියාව හා ඒ කෙරෙහි ඔහු තුළ ඇති උනන්දුව ආදිය පිළිබඳ වැඩි අවධානයක් යොමුකරන්නට ඇතැයි කල්පනා කළහැකිය. කෙසේ වෙතත් ළමා, තරුණ හා මහලු යන කවර වයස් මට්ටමක අයකු ප්‍රව්‍රජ්‍යාව සඳහා ඉදිරිපත් වුවත් ඒ ඕනෑම අයකුට ගිහි ජීවිතයෙන් සම්පූර්ණයෙන් ම වෙන්වී ගතකළයුතු බ්‍රහ්මචාරී ප්‍රතිපදාව හා ප්‍රව්‍රජ්‍යාව පිළිබඳ මූලික අවබෝධයක් ලබාදිය යුතුය. මේ අවබෝධය පැවිදිවීමට පෙර සම්පූර්ණයෙන් ම ලබාදිය නොහැකි වුවත් පැවිදි ජීවිතයට අවශ්‍ය මූලික කාරණා පිළිබඳව හෝ යම් ප්‍රමාණයක දැනුමක් ඒ තැනැත්තාට ලබාදීම අත්‍යවශ්‍ය වේ.

## 1. උපාධ්‍යාය හා ආචාර්ය පදවි

භික්ෂුවක් උපසම්පදා විනය කර්මයට භාජනය කිරීමට පෙර ඔහුට උපාධ්‍යායන් වහන්සේ නමක් හා ආචාර්යයන් වහන්සේ නමක් පත්කළ යුතුය. සැබැවින් ම මෙයින් අපේක්ෂා කළේ කුමක් දැයි විමසා බැලීම වැදගත්වේ. ශාසනයේ ස්ථිරත්වයට පත්වන භික්ෂුවට අවශ්‍ය දැනුම, ක්‍රියාශීලී බව හා ශක්තිය ලබාදීම මෙහි එක් අරමුණකි. අනෙක් අතට උපසම්පදාව ලබා වසර පහකින් පසුව භික්ෂුවකට ස්වාධීනව (තනිව) ආරාමයක වාසය කිරීමේ හැකියාව උදාවෙයි. ඒ වන විට තමා වෙත පැවැරෙන ඕනෑම ශාසනික කාර්යයක දී නොපැකිළව ඉදිරිපත්වී ක්‍රියා කිරීමට අවශ්‍ය පෞරුෂය ගොඩනැගීම උපාධ්‍යාය හා ආචාර්ය ඇසුරෙහි වාසය කිරීමෙන් භික්ෂුවකට උරුමවේ. එබැවින් මේ වත් මඟින් භික්ෂුව ශක්තිමත් කිරීමටත් ශාසනික සම්ප්‍රදාය ස්ථිරව පවත්වා ගැනීමටත් ලබාදෙන පිටු බලය සුළු නොවේ.

ගුරුවරයා හා ශිෂ්‍යයා එකිනෙකාට පිය-පුතු සෙනහසින් ක්‍රියාකළයුතු බව බුදුරජාණන් වහන්සේගේ උපදේශයයි.[8] අන්‍යෝන්‍ය වශයෙන් තම තමාගේ කටයුතු හා ආරක්ෂාව සම්බන්ධයෙන් ගුරුවරයා හා ශිෂ්‍යයා යන දෙදෙනා විසින් ම කල්පනා කළයුතුය. ලෙඩ රෝග වැළඳුණු අවස්ථාවක දී පමණක් නොව දෛනික කටයුතු ඉටුකර ගැනීමේ දී පවා අන්‍යෝන්‍ය උපකාරය ගුරු-සිසු දෙපිරිස අතර තිබිය යුතු බව වත්තක්ඛන්ධකයේ ගුරු-සිසු වත් මඟින් පෙන්වා දී තිබේ. භික්ෂූන් ගුරූපදේශවලින් තොරව ක්‍රියාකළ සමයේ ඔවුන්ගේ දුර්වල



චර්යාවන් දැක මහජනයා පළකළ අප්‍රසාදය නිසා එවැනි දෝෂාරෝපනවලින් තරුණ භික්ෂූන් මුදවා ගැනීමේ අරමුණින් උපාධ්‍යායවරයකු පත්කිරීමට සිදුවූ බව විනයෙහි දැක්වේ.[9] උපාධ්‍යායන් වහන්සේ යනු ශිෂ්‍යයාගේ ආධ්‍යාත්මික ගුණ සංවර්ධනය කිරීමේ මාර්ගෝපදේශකයායි.[10] උන්වහන්සේගේ අධීක්ෂණය කිසියම් හේතුවක් නිසා ශිෂ්‍යයාට නොලැබෙන අවස්ථාවක දී එය නියමිත පරිදි ලබාදීමේ අරමුණින් ආචාර්යවරයකු ද පත්කිරීමට කාලයාගේ ඇවෑමෙන් බුදුරජාණන් වහන්සේට සිදුවිය.[11] ඒ අනුව උපාධ්‍යායන් වහන්සේගේ ආදේශකයා වශයෙන් ශිෂ්‍යයාගේ කටයුතුවලට මැදිහත්වීම ආචාර්යවරයාට පැවැරුණු කාර්යයි.[12] මේ අනුව උපාධ්‍යාය හා ආචාර්ය යනුවෙන් හැඳින්වෙන ගුරුවරුන් දෙදෙනෙකුගේ මාර්ගෝපදේශනය ලබාගැනීමේ හැකියාව පැවිදි ශිෂ්‍යයකුට ලැබී තිබේ. ඒ දෙදෙනාම සිය ගුරුවරුන් සේ සලකා ශිෂ්‍යයා විසින් ක්‍රියා කළයුතු විය.

භික්ෂුවකට ආචාර්යවරයකු වීමට අවම වශයෙන් වස් දහයක් වත් සම්පූර්ණ වී තිබිය යුතුය. එපමණක් නොව උන්වහන්සේ ව්‍යක්ත හා ප්‍රතිබල සම්පන්න ගුණාංගවලින් යුක්ත ශිෂ්‍යයන්ට දැනමුතුකම් දීමෙන් ඔවුන් හසුරුවා ගැනීමට හැකියාව ඇති අයකු වීම ද අවශ්‍ය විය. සාමණේර භික්ෂූන් දෙනමකට වඩා පැවිදි කළ හැක්කේ එවැනි ප්‍රතිබල සම්පන්න දක්ෂ ආචාර්යවරයකුට පමණි.[13]

## 2. ගුරු-සිසු සබඳතාවයක වැදගත්කම

ගිහි සමාජයට වඩා සංඝ සමාජය සම්පූර්ණයෙන් ම වෙනස් එකකි. ව්‍යුහාත්මක සැකැස්ම, ආකල්ප හා චර්යාත්මක රටාව යන සෑම අංශයකින් ම මේ වෙනස දැකිය හැකිය. එබැවින් ගිහි සමාජයේ පවතින ගුරු-ශිෂ්‍ය සම්බන්ධතාවයට වඩා මුළුමණින් ම වෙනස් බවක් ශාසනික ගුරු-සිසු සබඳතාවයෙහි පවතියි. දීඝනිකායේ සිගාලෝවාද සූත්‍රයෙහි දක්ෂිණ දිශාවට නමස්කාර කිරීම නමින් දැක්වෙන්නේ ගිහි සමාජයේ ගුරු ශිෂ්‍ය සම්බන්ධතාවය පවත්වා ගැනීමට අදාළවන කාරණාවන් කීපයකි.[14] ගුරු-සිසු සබඳතාව පවත්වා ගැනීමට අදාළව චුල්ලවග්ගපාළියේ වත්තක්ඛන්ධකයේ දැක්වෙන කාරණාවලට අමතරව සිගාලෝවාද සූත්‍රයෙන් ඉදිරිපත් කෙරෙන එම කාරණා ද උපයෝගීකර ගැනීමට බාධාවක් නොමැත. භික්ෂු ශාසනික



02 OCT 2015

ගුරු-සිසු සබඳතාව අදියර දෙකකින් ක්‍රියාත්මක වේ. එයින් එක් අදියරක් නම් සාමණේර අවදියයි. කුල දරුවකු සසුන් ගතකළ මුල් කාලය සාමණේර අවස්ථාවයි. මේ කාලයේ දී සාමණේර භික්ෂුවක් විසින් අනුගමනය කළයුතු වත් පිළිවෙත් හෙරණ සික හා හෙරණ සික විනිස මඟින් දක්වා තිබේ.[15] වර්තමානයේ භාවිත කරන සාමණේර බණ දහම් පොතෙහි මේ කරුණු සැකෙවින් දක්වෙන අතර විශේෂයෙන් දිනචරියාව නමින් ඇති කොටසින් උපාධ්‍යාය හා ආචාර්යන් වහන්සේ කෙරෙහි පිළිපැදිය යුතු ආකාරය ද පෙන්වා දී තිබේ.[16] සාමණේර අවදියේ දී එම භික්ෂුවට ගුරු උපදේශවලින් තොරව ස්වාධීනව කටයුතු කිරීමේ හෝ ගුරු ආශ්‍රයෙන් තොරව ආරාමයක හුදෙකලාව වාසය කිරීමේ හැකියාවක් නොමැත. අනෙක් අදියර උපසම්පදාවෙන් පසුව එළැඹෙන වගකීම් පැවැරෙන කාලයයි. ශාසනික වශයෙන් භික්ෂුවට ස්ථිර තත්ත්වයක් ලැබෙන්නේ ද මින් අනතුරුව පැමිණෙන කාලයේ දීය. ශාසන සම්ප්‍රදායට අනුව උපාධ්‍යාය හා ආචාර්ය තනතුරු ලැබීමට පවා භික්ෂුව උපසම්පදාව ලැබීමෙන් පසුව ගතකළ වස් ප්‍රමාණය ගණනය කරනු ලැබේ. උපසම්පදාවෙන් පසුව වුවද ස්වාධීනවීමට සුදුසු අවස්ථාව පැමිණෙන තෙක් අවශ්‍ය උපදෙස් හා මාර්ගෝපදේශනය උපාධ්‍යාය හා ආචාර්ය ඇසුරෙන් ලබාගත යුතුය. මේ අවස්ථාවේ දී ගුරු-සිසු සබඳතාව පවත්වා ගැනීම පිණිස අනුගමනය කළයුතු නියමයන් ඉහතින් ද පෙන්වා දුන් පරිදි වත්තක්ඛන්ධකයේ ඇතුළත් 9-12 වත්වලින් ඉදිරිපත්කර තිබේ.

ගිහි සමාජයේ ගුරු-සිසු සබඳතාව සාමාන්‍යයෙන් එක්තරා කාල වකවානුවකට පමණක් සීමාවෙයි. මේ සම්බන්ධතාව පවත්වා ගැනීමේ දී විශේෂයෙන් ගුරු ශිෂ්‍ය යන දෙපිරිස අතර ආකල්පමය වශයෙන් වෙනසක් ඇතිකර ගතයුතුය. පාසල් අවදියේ ගුරු සිසු සබඳතාවයෙහි ආකල්ප වලට වඩා වෙනසක් විශ්වවිද්‍යාල අවදියේ ගුරු සිසු සබඳතාවයෙහි ආකල්ප වලින් මතුවී පෙනෙයි. පාසල් අවදියේ සිට විශ්වවිද්‍යාල අවදිය තෙක් කාලයේ ළමා වයසින් තරුණ වයසට එළැඹීමේ දී ශිෂ්‍යයා තුළ ඇතිවන වෙනස මත පිහිටා ක්‍රියා කිරීමට සිදුවන බැවින් මේ ආකල්පමය වෙනස දක්නට ලැබේ. එහෙත් ගුරුවරයා හා ශිෂ්‍යයා යන සංකල්පය කවර මට්ටමක දී වුවද වෙන්කර සැලකිය නොහැක්කකි. ගුරුවරයා කෙරෙහි ශිෂ්‍යයා විසින් දක්විය යුතු ගෞරවයත් ශිෂ්‍යයා පිළිබඳ ගුරුවරයාගේ අනුකම්පා සහගත හැඟීමත් කවර මට්ටක දී වුවද වෙනස් කළයුතු නොවේ. වර්තමාන සමාජයේ



ගුරු-සිසු දෙපිරිස අතර මතුවී ඇති බොහෝ ගැටලුවලට හේතුවී ඇත්තේ ගුරුවරයා කෙරෙහි දක්විය යුතු ගෞරවයත් ශිෂ්‍යයා කෙරෙහි තිබිය යුතු අනුකම්පාවත් පැවැතිය යුතු ආකාරයෙන් නොව කිසියම් වෙනසකට භාජනය වී තිබීම නිසායැයි කල්පනා කළහැකිය.

කුල දරුවකු සසුනෙහි පැවිදිවීමෙන් පසු ඔහු එතෙක් පවත්වාගෙන එමින් තිබූ ගිහි සමාජ සබඳතා සම්පූර්ණයෙන් නතර වෙයි. ප්‍රව්‍රජ්‍යාවෙන් පසු අලුත් සමාජ සබඳතා ගොඩනැඟෙන අතර ඊට අනුකූලව කටයුතු කරන්නට එම භික්ෂුවට පුහුණුවක් හා හුරුවීමක් ලබාදිය යුතුය. ශාසනික ජීවිතයේ දී මවත් පියාත් සහෝදර සහෝදරියන් හා ඥාතීනුත් සියලුදෙනා අන්තර්ගත වන්නේ පැවිදි සමාජය තුළයි. එබැවින් උපාධ්‍යායන් වහන්සේ හා ආචාර්යන් වහන්සේ පියාගේ හා මවගේ තැනට පත්වෙති. සබ්‍රහ්මචාරී භික්ෂූන් වහන්සේ සහෝදර සහෝදරියන් වශයෙන් සලකා කටයුතු කළයුතුය. එමෙන් ම ප්‍රව්‍රජ්‍යාවත් සමඟ හිමිවන ශාසනික උරුමය නිසා සමස්ත භික්ෂු සමාජය ම ඥාති පරපුරක් බවට පත්වෙයි. එම ඥාති පරපුරේ ආදිතමයන් වන දෑගසව් මහරහත් සැරියුත් හා මුගලන් උතුමන් වහන්සේලා පිළිබඳ සලකන විට තමාගේ ශාසනික උරුමය සම්බන්ධ අභිමානයක් හා තමන් කෙතරම් ගුණ සම්පන්නව මෙම ශාසන බ්‍රහ්මචරියාව සම්පූර්ණ කළයුතු ද යන උද්යෝගිමත් හැඟීම කෙනෙකුගේ සිතෙහි පහල වෙයි. ඒ උද්යෝගය මෙම වත් පිළිවෙත් සම්පූර්ණ කිරීමටත් පැවිදි ජීවිතයේ අරමුණු සාක්ෂාත් කරගැනීමටත් බෙහෙවින් ඉවහල් වෙයි. එබැවින් භික්ෂුත්වය ලබාගැනීමට පුහුණුවන කාලයේ සිට මේ ආකල්පය කෙනෙකු තුළ ඇති කිරීමෙන් ඔහුගේ බ්‍රහ්මචාරී ජීවිතය සඵලදායී කළහැකිව තිබෙන බව අප විසින් වටහාගත යුතුව ඇත.

බුදුරජාණන් වහන්සේ වරක් භික්ෂූන් අමතා දෑගසව්වන් ඇසුරු කරන ලෙසත් සැරියුත් මහරහතන් වහන්සේ භික්ෂූන්ට මවක වැනි යැයි ද මුගලන් මහරහතන් වහන්සේ පියාට සමාන යැයි ද හඳුන්වා දී ඇත.[17] භික්ෂූන්ට නායකත්වයක් දීමට නොසිතූ උන්වහන්සේ සඟ සසුන සංවිධානය කිරීම කෙරෙහි හා භික්ෂූන්ගේ ආධ්‍යාත්මික සංවර්ධනය කෙරෙහි කෙතරම් සැලකිලිමත් වී දැයි මෙයින් පැහැදිලි වේ. එමෙන් ම අන්‍යෝන්‍ය ගෞරවයෙන් හා පිළිගැනීමෙන් යුක්ත නිවැරැදි නායකත්වයක් වටා ඒකරාශී වූ ක්‍රමානුකූල පැවැතුම්වලින්

සමන්විත පරමාදර්ශී සමාජයක් බිහිකිරීමට බුදුරජාණන් වහන්සේ තුළ පැවැති උවමනාව මේ කරුණුවලින් මැනැවින් ප්‍රකට වේ.

ගුරුවරයා කෙරෙහි ශිෂ්‍යයාගේ නොමඳ ගෞරවයක් පැවැතිය යුතුවාක් මෙන් ම ගුරුවරයාගේ කටයුතුවල දී සහායවීම ද ශිෂ්‍යයාගේ වගකීමක් වශයෙන් සලකා ක්‍රියාකළ යුතු බව වත්තක්ඛන්ධකයේ ගුරු-සිසු වත්වලින් ඉදිරිපත් වන තොරතුරුවලට අනුව කල්පනා කළ හැකිය. ගුරුවරයා කෙරෙහි භක්තිමත් වූ ශිෂ්‍යයා අලුයම ගුරුවරයාට පෙර අවදිවිය යුතුය. මානව හිමිකම් ගැන කතාකරන ඇතැම් පුද්ගලයන්ට ශාසනික වත් පිළිවෙත් පිළිබඳ මේ නිර්දේශ අනුමත කිරීමේ ගැටලු තිබිය හැකිය. එහෙත් එසේ මානව හිමිකම් ගැන කතාකරන හා ඒවා ආරක්ෂා කළයුතු යැයි පවසන සමාජයේ තත්ත්වය සමඟ සසඳන විට මානව හිමිකම් ගැන කතාකරන සමාජයේ පැවැත්මට වඩා භික්ෂු සමාජයේ පැවැත් ම අතිශයින් ප්‍රශංසනීය වේ. සාමකාමී පැවැත්මෙන් හා පරාර්ථකාමී ක්‍රියා පිළිවෙතින් මානව හිමිකම් ගැන කතාකරන සමාජයට වඩා කීප ගුණයක් ඉදිරියෙන් භික්ෂු සමාජය ක්‍රියාත්මක වන බව පැහැදිලිව කිව හැකිය.

## 3. ශිෂ්‍ය මාර්ගෝපදේශනය

පුද්ගලයා ක්‍රමානුකූල ජීවිතයකට හුරුකරවීම එතරම් පහසු කාර්යයක් නොවේ. කෙසේ වෙතත් ක්‍රමානුකූල ජීවිතයකට ළමයකු හෝ තරුණයකු හුරුකර වුවහොත් එයින් එම පුද්ගලයාට මෙන් ම සමාජයට ද සිදුවන සේවය ඉමහත්ය. බුදුරජාණන් වහන්සේ හමුවීමට එක්තරා දිනක විහාරයට ගිය අජාසත්ත රජතුමා භික්ෂූන්ගේ සංවරශීලි භාවය පිළිබඳ පුදුමයට පත්වූයේය. කිසිම දඬුවමක් නොමැතිව අවවාදයෙන් පමණක් විශාල භික්ෂු පිරිසක් මෙතරම් සංවරශීලී චර්යාවකට නැඹුරු කිරීම පිළිබඳව රජු එම සාකච්ඡාවේ දී මවිතය පළකළේය. මෙයින් ප්‍රකට වන්නේ ගුරුවරයකු වශයෙන් බුදුරජාණන් වහන්සේ තුළ උන්වහන්සේට ම පමණක් ආවේණිකව පැවැති අසමාන හැකියාවයි. සෑම දරුවෙකුට ම ඔහුගේ ළමා කාලයේ හෙවත් ශිෂ්‍ය කාලයේ දී හොඳ මඟ පෙන්වීමක් ලබාදීම අනිවාර්යයෙන් සිදුවිය යුතුය. සමාජයේ ඉතාමත් කලාතුරකින් හමුවන සුභග දරුවකුට වුවද නිවැරැදි මඟපෙන්වීම සුදුසු අවස්ථාවේ දී ලබා නොදුන්නොත් ඔහුට අත්විය හැකි ඉරණම අමුතුවෙන් විස්තර කළයුතු නොවේ.



මාර්ගෝපදේශනයක් නොලබන ශිෂ්‍යයා තමා යා යුතු මඟ හෝ කළ යුතු නොකළ යුතු දේ තෝරා බේරා ගැනීමේ අපහසුතාවලට පත්වෙයි. එමෙන් ම ජීවිතයේ සියලු අත්දැකීම් යමෙකු තමා විසින් ම ලබාගැනීමට ගියහොත් ඒ සඳහා විශාල කාලයක් මිඩංගු කිරීමටත් ඒ වෙනුවෙන් ඔහුට කරදර රාශියකට මුහුණ දීමටත් සිදුවේ. එවිට බෙහෙවින් සිදුවන්නේ ජීවිතය පන්නරය ලබනවාට වඩා නීරසවීම හෝ සමාජ වෛරයක් ගොඩනැඟීමයි. මේ නිසා ගුරුවරුන්ගේ අවවාද අනුශාසනා මඟින් ලැබෙන අත්දැකීම් හා මඟ පෙන්වීම ශිෂ්‍යයන්ගේ ජීවන ගමන සාර්ථක කරගැනීමට ඉතා වැදගත්වේ. එබැවින් ගුරු-සිසු දෙපිරිස ම මේ පිළිබඳ නිවැරැදි වැටහීමකින් යුතුව සිටීම මෙහි දී අත්‍යවශ්‍ය කරුණකි.

ශිෂ්‍ය මාර්ගෝපදේශනයේ දී ගුරුවරයා ඉතාමත් කාරුණිකව හා ශිෂ්‍යයාගේ විශ්වාසය දිනාගෙන කටයුතු කිරීමේ හැකියාව ඇති අයකු වීම වැදගත්වේ. සැරියුත් මහරහතන් වහන්සේ වරක් සාමණේර භික්ෂු නමක් විසින් ලබාදුන් අවවාදය පවා පිළිගැනීමට තරම් අවවාදක්ෂම වූයේය. අස්සගුත්ත මහතෙරුණුවෝ නාගසේන කුමාරයා පැවිදි කිරීමේ අභිලාෂයෙන් සත් වසරක් කුමරුගේ නිවසට පිණ්ඩපාතයේ වැඩියහ. ගුණවත්, නැණවත් හා ප්‍රයෝජනවත් ශිෂ්‍යයකු නිර්මාණය කරගැනීම සඳහා ගුරුවරයකු විසින් බොහෝ කැපකිරීම් කරන්නට සිදුවන බව මේ ප්‍රවෘත්ති මඟින් සනාථ වේ.

## 4. ගුරු-සිසු වත්

උපාධ්‍යාය හා ආචාර්ය වත් (ශිෂ්‍යයා විසින් ගුරුවරයා පිළිබඳ පිළිපැදීම) නමින් සද්ධිවිහාරික හා අන්තේවාසික ශිෂ්‍යයා විසින් ගුරුවරයා වෙනුවෙන් පිළිපැදිය යුතු පිළිවෙල වත්තක්ඛන්ධකයෙහි වෙන වෙන ම දක්වා ඇතත් විස්තර වශයෙන් ඒ එකිනෙකෙහි කිසිදු වෙනසක් දැකිය නොහැකිය. එබැවින් පොදුවේ ශිෂ්‍යයා විසින් ගුරුවරයා පිළිබඳ පිළිපැදිය යුතු ආකාරය වශයෙන් සලකා එහි ඇතුළත් කරුණු මෙහි විමර්ශනයට ලක් කෙරේ.

සද්ධිවිහාරික හා අන්තේවාසික වත් නමින් මෙහි විස්තර වන්නේ ද එකිනෙකට කිසිදු වෙනස්කමක් නොමැති ගුරවරයා විසින් ශිෂ්‍යයා පිළිබඳව පිළිපැදිය යුතු ආකාරයයි. සංසන්දනාත්මකව බලන විට උපාධ්‍යාය හා ආචාර්ය වත්වලට වඩා සද්ධිවිහාරික හා

අන්තේවාසික වත්වල ඇත්තේ ඉතා සුළු වෙනස්කම් කීපයක් පමණි. එසේ නොවන්නට එහි එන බොහෝ කරුණු ගුරු-සිසු දෙපිරිස විසින් අන්‍යෝන්‍ය වශයෙන් ඉටුකර ගතයුතු කාරණාවන්ය. ගුරුවරයා විසින් ශිෂ්‍යයා පිළිබඳ පිළිපැදීමේ දී කරුණු දෙකක් මෙහි විශේෂයෙන් දක්වා ඇත. එනම්, ගුරුවරයා විසින් ශිෂ්‍යයාට සංග්‍රහ කිරීම හා අනුග්‍රහ කිරීමයි. එම සංග්‍රහ කිරීම හා අනුග්‍රහ කිරීම විධි හතරකින් කළහැකි බව ද සඳහන් වේ.

එනම්,

1. ධර්ම-විනය කියාදීමෙන් (දැනුම හෙවත් ඥාණය ලබා දීමෙන්)
2. නැවත නැවත විමසීමෙන් (අවශ්‍යතා විමසා බලා ඉටුකර දීමෙන්)
3. අවවාද දීමෙන් (දැනමුතුකම් හා උපදෙස් දීමෙන්) හා
4. අනුශාසනා කිරීමෙන් (මාර්ගෝපදේශනයෙන්) යන සිව් ආකාරයෙනි.[18]

මෙහි ගුරු-සිසු වත්වල දක්නට ඇති වෙනස්කම්වලට නිදර්ශනයක් වශයෙන් ගුරුවරයා රෝගී වුවද නැත ද ශිෂ්‍යයා විසින් මේ වත් අනුව පිළිපැදිය යුතුය. එහෙත් ගුරුවරයා විසින් මේ වත් අනුව පිළිපැදිය යුතු වන්නේ ශිෂ්‍යයා රෝගී තත්ත්වයෙන් පීඩාවට පත්ව සිටින අවස්ථාවේ දී ය. එහෙත් ශිෂ්‍යයාගේ අවශ්‍යතාව අනුව ඔහුගේ කටයුතුවලට උපකාර කිරීමට ගුරුවරයාට එයින් කිසිදු තහනමක් නොකෙරේ. පිය-පුතු සබඳතාව මත ගොඩනැගුණු ගුරු-සිසු සබඳතාවයක දී එවැනි අන්‍යෝන්‍ය සහයෝගයක් අපේක්ෂා කරන බැවින් එසේ කිරීමේ කිසිදු වරදක් ද නොමැත. එහෙත් ශාසනික සම්ප්‍රදාය තුළ පැවැතිය යුතු බ්‍රහ්මචාරී ආකල්පය මත ශිෂ්‍යයා රෝගී වූ අවස්ථාවක දී ගුරුවරයා විසින් මේ වත් විශේෂයෙන් ඉටුකළයුතු බව දක්වූවා වන්නට ඇත. රෝගී අවස්ථාවක දී ශිෂ්‍යයා පිණ්ඩපාතය සඳහා පිටත්වන්නේ නම් ගුරුවරයා කෙරෙහි ශිෂ්‍යයා පිළිපැදිය යුතු ආකාරයෙන් ම මෙහි දී ගුරුවරයා ශිෂ්‍යයා කෙරෙහි පිළිපැදිය යුතුය. ඒ අනුව අවශ්‍ය සියලු දේ සපයා දෙමින් ශිෂ්‍යයාට පිණ්ඩපාතයේ යාමට උපකාර කළයුතුය. මෙහි දී ගුරු-සිසු වත්වල ඇති වෙනස නම් ගුරුවරයාගේ පසු පසින් ශිෂ්‍යයා පිණ්ඩපාතයේ ගිය ද ගුරුවරයා විසින් ශිෂ්‍යයා රෝගීව සිටින අවස්ථාවේ දී වුවත් පසු පසින් යායුතු නොවීමයි.

අනඳ හිමියන් බුදුරජාණන් වහන්සේ වෙනුවෙන් වතාවත් ඉටුකළ ආකාරය විමසා බලන විට භක්තිමත් ශිෂ්‍යයකු විසින් තම ගුරුවරයාට



දැක්විය යුතු සැලකිලි හා ගෞරවය කෙබඳු දැයි වටහාගත හැකිය. ශිෂ්‍යයකු (අන්තේවාසිකයා) තුළ ගුරුවරයා පිළිබඳව තිබිය යුතු ගුණාංග පහක් විනයෙහි සඳහන් වේ. එනම්,

1. ශිෂ්‍යයා තුළ ගුරුවරයා කෙරෙහි ඇති වන අධික සෙනහස (ශිෂ්‍යයාගේ කටයුතු සඳහා ගුරුවරයා විසින් ලබාදෙන සහාය නිසා ශිෂ්‍යයා තුළ ඇතිවන බැඳීම)
2. ශිෂ්‍යයා තුළ ගුරුවරයා පිළිබඳව ඇති වන අධික ප්‍රසාදය (තමන්ට වඩාත් නිවැරදි මාර්ගයක් පෙන්වා දීමත් ජීවිතය ඔසවා තැබීමත් පිළිබඳ ශිෂ්‍යයා තුළ ගුරුවරයා පිළිබඳ ඇතිවන සතුට)
3. ගුරුවරයා ඉදිරියේ වඩාත් ලජ්ජාශීලිව ක්‍රියා කිරීම (ශිෂ්‍යයාට ඔහුගේ දුර්වලතා සඳහා අවවාද දීමෙන් පසු ඒවා නිවැරැදිව වටහා ගන්නා ඔහු තුළ තම වැරැදි පිළිබඳ ඇතිවන ආකල්පය)
4. ශිෂ්‍යයා තුළ ගුරුවරයා කෙරෙහි ඇති වන අධික ගෞරවය
5. ගුරුවරයා පිළිබඳව ඇති වන අධික මෛත්‍රී සහගත සිතිවිලි[19] (ශිෂ්‍යයා වෙනුවෙන් ගුරුවරයා දක්වන කැපවීම පිළිබඳ ශිෂ්‍යයාගේ සිතේ ඇතිවන කෘතවේදී හැඟීම්) යනුයි.

මෙවැනි හැඟීම්වලින් යුක්ත ශිෂ්‍යයන් ප්‍රව්‍රජ්‍යා ජීවිතයේ දී තමන්ට උපකාර වෙමින් මහා මෙහෙවරක් කළ ගුරුවරුන් අත්හරිත් යැයි සිතිය නොහැකිය. ඇතැම් අවස්ථාවල මතු කරන බරපතල මානසික ගැටලුවක් නම් වයෝවෘද්ධ දෙමාපියන්ට සැලකීමට කෙනෙකු නොමැති නිසා අකමැත්තෙන් වුවද ගුරුවරයා හැරයාමට සිදුවන බවයි. මේ පිළිබඳ බුදුරජාණන් වහන්සේගේ අනුශාසනා අනුව සලකා බලන විට එවැනි ප්‍රකාශයකට ඉඩක් නොමැති බව පෙනේ. උන්වහන්සේ තරම් දෙමාපියන්ට සැලකීමෙහි අගය ලෝකයාට කියා දුන් වෙනත් ශාස්තෘවරයෙකු නොමැත්තාහ. බුදුරජාණන් වහන්සේ භික්ෂූන්ට තමන් පිණ්ඩපාතයෙන් ලබා ගන්නා සිව් පසයෙන් පවා දෙමාපියන් පෝෂණය කිරීමට සිදුවේ නම් එසේ කරන මෙන් අනුශාසනා කළහ. එබැවින් දෙමාපියන්ට සැලකීමට භික්ෂුවට බාධාවක් නොමැති බවත් ඒ සඳහා අවශ්‍ය වන්නේ නම් සිය ආරාමය වුවද සුදුසු පරිදි යොදා ගැනීමේ හැකියාව ඇති බව ද මෙහි දී සඳහන් කළයුතුය.

**ගුරු ගෞරවය:**

උපාධ්‍යායන් වහන්සේට හා ආචාර්යන් වහන්සේට ශිෂ්‍යයා විසින් කළයුතු වත් යනු උන්වහන්සේ (ගුරුවරයා) කෙරෙහි සද්ධිවිහාරික හා අන්තේවාසික භික්ෂුව (ශිෂ්‍යයා) විසින් පිළිපැදිය යුතු ආකාරයයි.[20] ගුරුවරයාට වත් සපයන ශිෂ්‍යයා විසින් ගෞරවය උපදවාගෙන එම වත් සිදුකළ යුතුය. ගුරුවරයා අවදිවීමට පෙර ශිෂ්‍යයා අවදි විය යුතුය. එයින් ගුරුවරයා කෙරෙහි ශිෂ්‍යයා තුළ ඇති භක්තිය හා ගෞරවය පිළිබිඹු වන අතර ශිෂ්‍යයාගේ කාර්යක්ෂම හා උද්යෝගිමත් බව ද ප්‍රකට කෙරේ. ශිෂ්‍යයා තමන් පැළඳ සිටින පාවහන් ගලවා පසෙකින් තබා සිවුර ඒකාංසවන සේ පෙරවාගෙන වත් සිදු කිරීම ගුරුවරයාට ගෞරවය දක්වීමකි. සද්ධිවිහාරික හා අන්තේවාසික වත් අනුව උදෑසන ම අවදිවන ශිෂ්‍යයා ගුරුවරයා අවදිවූ විට මුහුණ සේදීමට අවශ්‍ය පැන් (ජලය) හා වෙනත් උපකරණ සපයා දෙයි. අනතුරුව සුදුසු අසුන් පනවා කැඳ පිළිගැන්වීමත් එය වැළඳීමෙන් පසු අසුන් පෙර තුබූ පරිදි සකසා භාජනය පිරිසිදුකර සුරක්ෂිතව අසුරා තැබීමත් කරයි. ගුරුවරයා කැඳ ආදිය වැළඳූ පසු එම භාජන නොගැටෙන පරිදි සේදීම ද උන්වහන්සේට කරන ගෞරවයක් සේ සැලකිය හැකිය.

**අවවාදක්ෂම බව:**

ගුරුවරයා කථා කරන විට එම කථාව නිමවන්නට පෙර ශිෂ්‍යයා අතර මැද කථා නොකළ යුතුය. යම් ශිෂ්‍යයෙකු විසින් එසේ කිරීම එක් අතකින් ගුරුවරයාට කරන අගෞරවයකි. අනෙක් අතින් ගුරුවරයා කියන්නට යන දේට බාධා කිරීමෙන් පවසන දේ නිවැරැදිව හා අවධානයෙන් අසා ගැනීමට ඉඩ නොලැබේ. මේ නිසා ගුරුවරයාගේ කරුණු දක්වීම හමුවේ ශිෂ්‍යයා ඉවසිලිවන්ත හා අවවාදක්ෂම වීම වැදගත් වේ. එයින් ලැබෙන මාර්ගෝපදේශනයට අමතරව ශිෂ්‍යයාට තමාගේ වාරය පැමිණෙන තෙක් සාවධානව සිටීමට අවශ්‍ය පුහුණුව ලැබේ. තවද සියල්ල අසා දැනගත් බැවින් තමන් කරුණු දක්වීමේ දී වඩාත් ප්‍රබල ලෙස තමාට අදහස් ඉදිරිපත් කිරීමේ අවස්ථාව ද හිමිවේ.



**සංග්‍රහ කිරීම:**

ශිෂ්‍යයා අලුයම ගුරුවරයාට මුහුණ සෝදා ගැනීමට අවශ්‍ය පැන් හා දැහැටි දඬු ආදි වෙනත් උපකරණත් පිළිගන්වා අනතුරුව අසුන් පනවා කැඳ (හෝ ගිලන්පස ආදිය) පිළිගන්වයි. පැරැණි ආරාමවල අවශ්‍ය අවස්ථාවේ දී පමණක් අසුන් පනවා ගත් බව ගුරුවරයා අසුනින් නැඟී සිටි වහා එය අහුරා තැබිය යුතු බවට නියම කිරීමෙන් සිතිය හැකිය. කලින් පනවා තිබූ අසුනක් වුවද ඒ අවස්ථාවේ දී පිරිසිදු කර සකස් කිරීම අසුන් පැනවීමකි. එසේ කළ නොහැකි නම් ඒ සඳහා ආචාර්යන් වහන්සේ උනන්දු කරවීම හෝ ශිෂ්‍යයා විසින් කළ යුතුය. මෙයින් ප්‍රකට වන්නේ අන්‍යෝන්‍ය උපකාරයෙන් ක්‍රමානුකූලව සකස්වූ උද්යොගිමත් හා නිරෝගී සම්පන්න ජීවිතයකට ගුරු ශිෂ්‍ය සම්බන්ධතාව මඟින් අවශ්‍ය මඟ පෙන්වීම කර ඇති බවයි.

ගුරුවරයාගේ සිවුරු ආදිය අපිරිසිදුව සේදිය යුතු තත්ත්වයක තිබේ නම් ශිෂ්‍යයා විසින් ඒවා සෝදා දිය යුතුය. එසේ නොමැති නම් සිවුරු සෝදා ගැනීම සඳහා ගුරුවරයා උනන්දු කරවිය යුතුය. ගුරුවරයාට සිවුරක් සකසා ගැනීමට ඇති විටක ද සිවුරු පඬු පෙවීම් ආදි කාර්යයක් එළැඹි විට ද ඒවා කරදීම ශිෂ්‍යයාගෙන් අපේක්ෂා කෙරේ.

**සෞඛ්‍ය සම්පන්න විධි:**

ගුරුවරයා කෙරෙහි පිළිපදින ශිෂ්‍යයා පිරිසිදු බවින් හා ක්‍රමානුකූල බවින් යුක්තව එම වත් ඉටුකිරීමට ද දක්ෂ වියයුතුය. ගුරුවරයාට කැඳ (හෝ ගිලන් පස) ආදිය පිළිගන්වන ශිෂ්‍යයා විසින් එම භාජන පළමුව හොඳින් පිරිසිදු කර කැඳ ආදිය පිළිගැන්විය යුතුය. ගුරුවරයා එය වළඳා අවසන් වූ වහාම පැන් පිළිගන්වා වැළඳූ භාජනය පිළිගෙන එය සෝදා නියමිත ස්ථානයේ තැන්පත් කළ යුතුය. භාජන සෝදන විට ද ඒවා පහතට කර (එකිනෙකට හෝ) වෙනත් කිසිවක හෝ නොගැටෙන පරිදි සෝදා පිරිසිදු කළ යුතුය. මෙවැනි වත් අනුගමනය කිරීමෙන් ආරාමය තුළ පවිත්‍රතාව, භාණ්ඩවල සුරක්ෂිත බව මෙන් ම පුද්ගල සෞඛ්‍යය ද උපරිම අන්දමින් රැකගත හැකිය. කැඳ වැළඳූ පසු පැන් පිළිගැන්වීමෙන් මුඛය ධෝවනය කරගැනීමට හැකිවීම මුඛ සෞඛ්‍ය සම්බන්ධයෙන් වැදගත් කාරණයකි. එබැවින් එසේ පැන්

පිළිගැන්වීම එවැනි යහපත් චර්යාවක් අනුගමනය කිරීමට කරන පෙළඹවීමක් ද වෙයි. කිසියම් ආහාරයක් ගත් පසු මුඛය පිරිසිදු නොකිරීමෙන් දත්වලට වන හානිය හා ඇතිවන මුඛ දුර්ගන්ධය පිළිබඳ මෙහි දී විස්තර කළයුතු නොවේ. ඇතැම් විට කැඳ, ගිලන්පස ආදිය පිළිගැන්වූ භාජන නියමිත පරිදි පිරිසිදු නොකිරීමෙන් මැස්සන් ආදි කෘමි සතුන් බෝවීමෙන් ඇති වන අපහසුතා ගැන ද සලකන විට මේ වත් මඟින් පෙන්වා දෙන ආකාරයට ක්‍රියා කිරීමෙන් සෞඛ්‍ය සම්පන්න ජීවිතයකට කෙරෙන මඟ පෙන්වීම කෙතරම් වැදගත් දැයි මැනැවින් ප්‍රකටවේ.

**ක්‍රමානුකූල බව හා සුරක්ෂිත බව:**

පිණ්ඩපාතයේ වඩින්නට අපේක්ෂාවෙන් සිටින ගුරුවරයාට ඊට සූදානම්වීම සඳහා වුවමනා කරන සිවුරු ආදිය සපයා දීම ද පාත්‍රය සෝදා ජලය සමඟ පිළිගැන්වීම ද කළ යුතුය. මෙසේ ජලය සමඟ පාත්‍රය පිළිගැන්වීමෙන් ගුරුවරයාට ද අත් පිරිසිදු කරගැනීම සඳහා එයින් පහසු වෙයි. ගුරුවරයා තමා ද කැටුව යාමේ අදහසකින් සිටින්නේ නම් තමන් ද තෙමඬුලු වසා අඳනය හැඳ සුදුසු ලෙස සිවුරු පෙරවා ගෙන පසු ගමන් යන භික්ෂුව වශයෙන් පිටත්විය යුතුය. එහිදී ගුරුවරයාට දුරත් නොව, ළඟත් නොව, සංසුන් ගමනින් පසුගමන් කරමින් පාත්‍රයට ලැබෙන දේ පමණක් පිළිගත යුතුය. පිණ්ඩපාතයේ වඩින විට ශිෂ්‍යයා ගුරුවරයාට පිටුපසින් ගිය ද ආපසු එන ගමනේ දී ගුරුවරයාට කලින් ශිෂ්‍යයා විහාරස්ථානයට පැමිණ අසුන් ආදිය පැනවීම කළ යුතුය. පිණ්ඩපාතයේ වැඩමවා වෙහෙසට පත්වී පැමිණෙන ගුරුවරයාට පා සෝදා ගැනීමට ජලය, දෙපා තබා ගැනීමට පාපුටුව ද සකස්කර තබා පෙර මඟට ගොස් පාත්‍ර සිවුරු පිළිගත යුතුය. දහඩිය තැවරුණු සිවුරු මඳ අව්වේ වියලාගෙන නියමිත පරිදි නවා සුදුසු තැනක තැබිය යුතුය. සිවුරු වියලීමේ දී එය වැඩි වේලාවක් අව්වේ නොතැබිය යුතුය. සිවුර නවන විට ද එහි මැදින් නොනැමෙන පරිදි සිවුරේ කොන් අඟල් හතරක් පමණ උඩට ඇද නැවිය යුතුය. සිවුරේ මැද කොටස එය පරිහරණයේ දී ඉක්මනින් දුර්වල වියහැකි බැවින් මෙවැනි සැලකිල්ලක් දැක්වීම සිවුරේ සුරක්ෂිත බව සම්බන්ධයෙන් වැදගත් කාරණා වේ. කාය බන්ධනය (බඳ පටිය) අස්ථාන ගතවිය හැකි බැවින් එය නැවූ සිවුරට මැදිකර තැබිය යුතුය.



ඇතැම් අවස්ථාවක තද අව්වේ සිවුරු වේලීමෙන් ඊට වන හානියත් දින ගණන් සිවුරු වැනූ තැන්වල දමා තිබීමෙන් වන අපවිත්‍රතාවත් වළකා ගන්නේ කෙසේ දැයි මේ කරුණු මඟින් මනාව පැහැදිලි වේ.

අනතුරුව ගුරුවරයාට දානය පිළිගැන්විය යුතුය. දත් පිළිගැන්වීමේ දී අවශ්‍ය දේ විමසමින් ඒ අනුව තිබෙන දැ සකස්කර පිළිගැන්විය යුතුය. දානය වැළඳීමෙන් පසු පාත්‍රය ද හොඳින් සෝදා මඳ වේලාවක් අව්වේ තබා එය සුරක්ෂිතව තබන ස්ථානයේ යමක් අතුරා පාත්‍රය ඒ මත තැබිය යුතුය. එසේ කිරීමෙන් පාත්‍රය මල බැඳීමට ඇති ඉඩ වළකාලීම මෙයින් අපේක්ෂා කෙරිණි. සිවුරු අසුරා තබන විට ද ඒ සඳහා භාවිත කරන උණලීය හෝ ලණුව අතින් පිස දමා සිවුරු තැන්පත් කළයුතුය. එසේ කිරීමෙන් එහි ඇති අපවිත්‍ර දැ සිවුරෙහි තැවරීමට තිබෙන ඉඩ වළකාලීම අපේක්ෂාව විය. සිවුරු තබන විට ද එහි නැවුණු කොන් මෙහා (පෙනෙන) පැත්තට සිටින සේ තැබිය යුතුය. සිවුරු කොන් නිතර පෙනෙන පරිදි තැබීමෙන් එහි ඇතුළට කෘමි ආදි සතුන් යාම වළකාගත හැකිය. ඇතැම් ඉතා සුළු දෛනික කටයුතුවල දී නොසැලකිලිමත් භාවය නිසා අපතේ යන කාලය හා සිදුවිය හැකි අපහසුතා කෙතරම් මඟ හරවා ගතහැකි ද යන බව මේ වත් මඟින් ඉදිරිපත් කරන කාරණා තුළින් පැහැදිලිව හඳුනාගත හැකිව තිබේ. එමෙන් ම ආරාමය තුළ නිතර පරිහරණය කරන බාජන පිරිසිදුව හා සුරක්ෂිතව තබා ගැනීම සම්බන්ධයෙන් ලැබෙන මේ උපදෙස් වැඩි පිරිසක් ජීවත්වන ස්ථානයක එකිනෙකාට අපහසුවක් නොවන පරිදි ගතකළහැකි ක්‍රමානුකූල දිවි පෙවතකට කෙතරම් වැදගත් දැයි සිතා බැලීම ප්‍රයොජනවත්ය. ශිෂ්‍යයා රෝගී වූ විට මේ කටයුතු ක්‍රමවත්ව ඉටුකිරීමේ වගකීම ගුරුවරයා සතු වේ.

**ස්නානය සඳහා පහසුකම් සපයාදීම:**

ගුරුවරයා ස්නානය කිරීමට කැමැත්ත පළකළ විට ඒ සඳහා ජලය හා වෙනත් අවශ්‍ය දේ ශිෂ්‍යයා විසින් සම්පාදනය කළයුතුය. සිසිල් දිය, උණු දිය හා ඇඟ ගල්වන සුණු හා මැටි ආදිය පිළියෙල කරදීම හෝ ගුරුවරයා ජන්තාඝරයට ගොස් ස්නානය කිරීමට කැමැති නම් එහි එක්කරගෙන ගොස් ස්නානය කරවිය යුතුය. වර්තමානයේ භාවිත කරන සබන් හා සැම්පූවලට ආදේශක වශයෙන් අතීතයේ ජලස්නානයේ දී මැටි හා ඖෂධීය වෙනත් කුඩු වර්ග ඇඟ ගැල්වීමට

යොදාගත් බව පෙනේ. ජන්තාඝරයේ ගිනිදැල්වලින් මුහුණට හා අභ්‍යන්තර ඉන්ද්‍රියන්ට සිදුවිය හැකි හානිය වළක්වා ගැනීමට මුහුණෙහි මැටි ආලේප කර ශරීරය ඉදිරි පසින් හා පිටු පසින් වසාගෙන එහි පිවිසිය යුතු බව දක්වේ. එමෙන් ම තමන් ගුරුවරයා සමඟ ජන්තාඝරයට යන විට ඒ වන විටත් එහි ගෙස් සිටින නවක හෝ වැඩිහිටි භික්ෂූන්ට අගෞරවයක් නොවන පරිදි ඉතා සංවරව හැසිරිය යුතුය. එහි දී ගුරුවරයා නැහැවීම ආදි අවශ්‍ය කටයුතු තමා විසින් කළයුතුය. අනතුරුව තමන් පළමුවෙන් දිය සිසගෙන සිවුරු හැඳ පෙරවාගෙන ගුරුවරයාගේ ඇඟ පිසදමා සිවුරු පිරිකර පිළිගන්වා ආරාමයට කැඳවාගෙන අවුත් අසුන් පනවා වාඩිකළ යුතුය. ශිෂ්‍යයා රෝගී වූ අවස්ථාවක දී ගුරුවරයා විසින් ශිෂ්‍යයා වෙනුවෙන් මේ කටයුතු සිදුකළ යුතුය.

ආරාමයට පිවිසෙන විට දෙපා සෝදාගත යුතු බැවින් ඒ සඳහා ජලය සම්පාදනය කිරීම සෑම විට ම සිදුකළයුතු කාර්යයක් වූයේය. උණු පැන් ස්නානය කිරීමෙන් පසු පිපාසය ඇති වියහැකි බැවින් ගුරුවරයා විමසා බලා බීමට පැන් පිළිගැන්විය යුතුය. අනතුරුව තමා ඉගෙන ගතයුතු හා අසා දැනගත යුතු දේ ගුරුවරයාගෙන් විමසා ඉගෙන ගත යුතුය. අධ්‍යාපනය ලබාගැනීමට සුදුසු විවේක අවස්ථාව ඒ සඳහා යොදා ගැනීමට පියවර ගත් බව මෙයින් ප්‍රකට වේ. අනෙක් අතට උදෑසන සිට ශිෂ්‍යයා විසින් ඉටුකළ ඒත් අනුව ස්වකීය කටයුතුවල දී පහසුකම් සලසාගත් ගුරුවරයාට ඉතාමත් කරුණාවෙන් ශිෂ්‍යයාගේ අධ්‍යයන කටයුතුවලට මඟ පෙන්විය හැකිය. මෙබඳු ක්‍රියා කලාපයක් තුළින් ගොඩනැගෙන ගුරු-සිසු සබඳතාව අන්‍යෝන්‍ය සෙනහසින් බැඳුණු කෙතරම් ප්‍රිය මනාප හා ශක්තිමත් වූවක් දැයි වටහා ගැනීම අපහසු නොවේ.

**ආරාමය ශුද්ධ පවිත්‍ර කිරීම:**

ගුරුවරයා වැඩ සිටින කුටිය මෙන් ම ආරාමය ඇතුළත හා පිටත ගෙමිදුල් අපිරිසිදු වී ඇති විට ඒවා ශුද්ධ පවිත්‍ර කිරීම ද ශිෂ්‍යයා විසින් තමාට ඒ සඳහා හැකියාවක් තිබේ නම් ඉටුකළ යුතුය. මෙහි දී හැකියාවක් තිබේ නම්[21] එම කටයුතු කළයුතු බව දක්වීමෙන් ශිෂ්‍යයාගේ නිදහස හා ඔහුගේ මූලික පරමාර්ථ ඉටුකර ගැනීමට අවශ්‍ය කාලය ඔහුට සපයාදීම කෙරෙහි අවධානය යොමු වී තිබෙන බව



පෙනේ. අනෙක් අතට ශිෂ්‍යයාගෙන් සියල්ල ඉටුවන තෙක් බලා නොසිට ගුරුවරයා විසින් ද ඇතැම් කටයුතු කරගන්නා බැවින් හා ආරාමිකයන් (ආරාමයේ සේවා සපයන්නන්) විසින් ඉටුකරන කාර්යයන් ද වන බැවින් එසේ දක්වූවා වියහැකිය. කෙසේ වෙතත් ශුද්ධ පවිත්‍ර කිරීමේ දී ඒවා කළයුතු පිළිවෙල මේ යැයි දක්වන මෙම විස්තර අනුව කෙතරම් සංයමයෙන් හා ක්‍රමානුකූලව එම කටයුතු කිරීමට මඟ පෙන්වා තිබේ දැයි වටහාගත හැකිය. ශිෂ්‍යයා රෝගීව සිටින අවස්ථාවක දී මේ පවිත්‍ර කිරීමේ කාර්යය ද ගුරුවරයා විසින් ඉටුකළ යුතුවේ.

ආරාමයේ කුටි ඇතුළත පිරිසිදු කරන විට සියලු බඩු බාහිරාදිය කාමරයෙන් පිටතට රැගෙන සුරක්ෂිතව තබා පවිත්‍ර කළයුතුය. එහි දී ප්‍රථමයෙන් ම සිවුරු, කොට්ට ආදි සැහැල්ලු භාණ්ඩ බැහැරට ගෙන පසෙක තැබිය යුතුය. මීළඟට ඇතිරිලි හා වෙනත් දේ ඉවත් කළයුතුය. ඉන්පසු පුටු, නිදා ගැනීමට යොදා ගන්නා ලෑල්ල, හේත්තු වන පුවරුව ආදි භාණ්ඩ ඒවා එකිනෙක හා බිත්තිවල නොගැටෙන පරිදි බැහැර කළයුතුය. අනතුරුව පඩික්කම හා බුමුතුරුණු අතුරා ඇති ආකාරය අනුව ක්‍රමානුකූලව ඉවතට ගත යුතුය. ඉන්පසු ශුද්ධ පවිත්‍ර කිරීමේ දී පළමුවෙන් මකුළු දැල් බැඳ තිබේ නම් උඩ සිට පහතට ඒවා කඩා ඉවත් කළයුතුය. දොරපළු අතර හා කවුළු ද හොඳින් පිස දමා පවිත්‍ර කළයුතුය. බිත්තිවල කුණු අධික නම් රෙදි කඩක් තෙමා මිරිකා පිරිමැදිය යුතුය. බිම දූවිලිවලින් පිරී ඇති විටක ජලය ඉස ඇමදිය යුතුය. රැස් කළ කසළ සුදුසු එක් ස්ථානයකට ගොඩ ගැසිය යුතුය. ඉන්පසු ගෙතුළින් බැහැරට ගත් බුමුතුරුණු ආදිය අව්වේ වියලා දූවිලි ගසා ඇතුළට ගෙන පෙර තුබූ පරිදි ම තැබිය යුතුය. අනෙක් සියලු භාණ්ඩ ද දූවිලි පිසදා පිරිසිදු කළයුතුය. අනතුරුව එම භාණ්ඩ පිටතට ගත් පිළිවෙලෙහි අවරෝහණ ක්‍රමයට රැගෙන ගොස් ගෙතුළ තැන්පත් කිරීම කළයුතුය. සුළං හමන දිශාව අනුව සලකා බලා එම දිශාවේ ජනේල වැසිය යුතුය. එයින් දූවිලි සහිත සුළඟ ගේ තුළට පැමිණීම වළක්වා ගත හැකිය. පැන් භාජනවල පැන් නොමැති නම් පැන් ගෙනවුත් එම භාජන පුරවා තැබිය යුතුය. මෙසේ ආරාමික ජීවිතයේ දෛනික අවශ්‍යතා සම්පූර්ණ කරගැනීමට මෙන් ම ආරාමික පරිසරයේ පවිත්‍රතාව රැකගැනීමට ද විශේෂ අවධානයක් යොමු කිරීම මේ වත් ඉටුකිරීම තුළින් අපේක්ෂා කළ බව පෙනේ. මේ වත් දෛනිකව ක්‍රියාත්මක වන විට තැන තැන කුණු ගොඩ ගැසුණු මකුළු දැලින්

02 OCT 2015

පිරිගිය ආරාමයක් දකින්නට තබා ඒ පිළිබඳ සිතන්නට පවා හැකියාවක් නොමැති බව කිවහැකිය.

**ගුරුවරයාට කල්‍යාණ මිත්‍රයකු වීම:**

යම්කිසි විදියකින් ස්වකීය ගුරුවරයාගෙන් පැවිද්දෙහි නොඇල්මක් පිළිබඳ අදහස් ප්‍රකාශ වූ විට ශිෂ්‍යයා මැදිහත් වී ගුරුවරයා පැවිද්දෙහි උනන්දු කළයුතුය. ගුරුවරයාට ධර්ම-විනය විරෝධී කාරණයක් පිළිබඳ සැකයක් මතුවූ විට ශිෂ්‍යයා ඉදිරිපත්වී එම සැකය දුරු කිරීමට ක්‍රියාකළ යුතුය. තමාට එසේ කළ නොහැකි වුවහොත් වෙනත් සුදුසු අයකු ලවා හෝ ගුරුවරයාට ධර්ම-විනය සිහි ගැන්විය යුතුය. ගුරුවරයා ගරු ඇවතකට පත්වී නම් එයින් නිදහස් කරගැනීමට අවශ්‍ය සංඝ කර්මයකට භාජනය කිරීමට ශිෂ්‍යයා විසින් සංඝයා උනන්දු කරවිය යුතුය. මෙයින් පෙන්වා දෙන්නේ කවර මට්ටමේ තත්ත්වයක දී වුවද ශිෂ්‍යයා විසින් ස්වකීය ගුරුවරයා ආරක්‍ෂා කරගැනීමට පියවර ගන්නා බවත් උන්වහන්සේ සිල්වත් හා ගුණවත් ආචාර්යයන් වහන්සේ නමක වශයෙන් සංඝ සමාජයේ පෙනී සිටිනු දැකීම ශිෂ්‍යයාගේ අභිලාෂයක් ද වන බවයි. ගුරුවරයා යනු මාර්ගෝපදේශකයායි. එබැවින් ශිෂ්‍යයා තම මාර්ගෝපදේශකයා ආරක්‍ෂාකර ගැනීමට අවශ්‍ය පියවර ගැනීම තමාගේ අනාගත පැවැත්ම සම්බන්ධයෙන් ද වැදගත් පියවරක් වන බව නැණවත් ශිෂ්‍යයා වටහාගෙන ක්‍රියා කරයි.

අනෙක් අතට ශිෂ්‍යයාට පැවිද්දෙහි කලකිරීමක් ඇති වූ විට ගුරුවරයා විසින් ඊට සුදුසු උපදෙස් ලබාදී ඔහු පැවිදි ජීවිතය කෙරෙහි උනන්දු කළ යුතුය. තිස්ස විහාරයේ විසූ තිස්ස නම් සාමණේර නම පැවිද්ද පිළිබඳ කලකිරී ගිහිවීමට කල්පනා කළ අවස්ථාවේ උන්වහන්සේගේ ගුරුවරයා විසින් ඒ සාමණේර නම පැවිද්දෙහි උනන්දු කරවීමට ක්‍රියාකළ ආදර්ශමත් පුවතක් මජ්ඣිම නිකාය අට්ඨකථාවේ විතක්කසණ්ඨාන සූත්‍ර වර්ණනාවේ ඉදිරිපත් වේ.[22] එහි සඳහන් පරිදි ශිෂ්‍යයාගේ කලකිරීම වටහාගත් ගුරුවරයා ශිෂ්‍යයාගේ සිතිවිලි වෙනස් කිරීමට අවවාද දීමෙන් උත්සාහ කරනවාට වඩා ඔහුගේ එම අරමුණ වෙනත් සිතිවිල්ලකට මාරු කිරීමට කටයුතු යෙදුවේය. එසේ සිතා ශිෂ්‍යාගේ මුල් අදහස ප්‍රමාද කරවීමට උපක්‍රමයක් වශයෙන් තිස්ස විහාරයේ ස්නානයට ජලය හිඟ නිසා



02 OCT 2015

තමන් චිත්තල පබ්බත (සිතුල්පව්) විහාරයට රැගෙන යන මෙන් ශිෂ්‍යයාගෙන් ඉල්ලා සිටියේය.[23] සිය ආචාර්යන් වහන්සේගේ ඉල්ලීමට අවනත වූ ශිෂ්‍යයා උන්වහන්සේ එහි රැගෙන ගියේය. එහි ගිය පසු සිතුල්පව් විහාරයේ සංඝයා බහුල බැවින් තමන්ට හුදෙකලාව වාසය කිරීමට සුදුසු කුටියක් සාදා දෙන මෙන් ශිෂ්‍යාගෙන් ඉල්ලීමක් කළේය.[24] එය ද ඉටුකිරීමෙන් පසු තම අරමුණ සාක්ෂාත් කරගත හැකි යැයි සිතූ සාමණේර නම සිය ගුරුවරයා වෙනුවෙන් තම දැතින් ම ඉදිකරදෙන කුටිය වහ වහා ඉදිකළේය. කුටියෙහි වැඩ නිම කළ ශිෂ්‍යනම ඒ බව ආචාර්යන් වහන්සේට දැන්වීය. උන්වහන්සේගේ එවර ඉල්ලීම වූයේ මා වෙනුවෙන් ඔබ විසින් ඉතා මහන්සියෙන් නිමකළ මේ කුටියේ පළමු දින රාත්‍රිය ඔබ ම වාසය කරනු දැකීම ගුරුවරයා වශයෙන් තමන්ගේ ආදරණීය ප්‍රාර්ථනාව බවයි.[25] තවත් එක් රාත්‍රියක් ගුරුවරයා සමඟ සිටීමෙන් තම අරමුණ ඉටුකර ගැනීමට කිසිම බාධාවක් නොවන බව කල්පනා කළ ශිෂ්‍යනම ගුරු බැතියෙන් එම ඉල්ලීමට ද අවනත වූයේය. එදින රාත්‍රිය මේ ශිෂ්‍යනමට සිය ජීවිතයේ සුවිශේෂ ම දිනය බවට පත් වූයේ විදර්ශනාව පාදක වී අර්හත්වයට පත්වීම නිසයි. ආචාර්යන් වහන්සේගේ උත්සාහය ශිෂ්‍යයා ද නොදැනම ඉටුවීම කෙතරම් සාර්ථක උපක්‍රමයක් දැයි මේ ප්‍රවෘත්තියට අනුව කෙනෙකුට කල්පනා කළහැකිය. ගුරු-සිසු දෙපිරිස අන්‍යෝන්‍ය අවබෝධයෙන් හා උපකාරයෙන් ශාසන බ්‍රහ්මචරියාව සම්පූර්ණ කරගනිමින් ආධ්‍යාත්මික ශාන්තිය පසක් කරගැනීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරගැනීම මේ අනුව මෙම වත් ඉටුකිරීමෙන් අපේක්‍ෂිත අවසාන ඉලක්කය බව වටහා ගත හැකිය.

**ආරාමික සම්පත් ආරක්‍ෂා කිරීම:**

ගුරුවරයා නොවිමසා ආරාමයේ ඇති කිසිම දෙයක් වෙනත් අයෙකුට ලබාදීම ශිෂ්‍යයාගේ කාර්ය නොවේ. එමෙන් ම වෙනත් කෙනෙකුට අයත් දෙයක් තමන් විසින් පිළිගැනීම ද නොකළ යුතුය. තමන්ගේ කෙස් කපා ගැනීමට පවා ගුරුවරයා විමසා අවසර ලබාගැනීමට තරම් ශිෂ්‍යයා නිහතමානී වියයුතු බව මෙහි දැක්වේ. එමෙන් ම වෙනත් අයකුගේ කෙස් කැපීම ද ගුරුවරයාගේ අවසරයක් නොමැතිව නොකළ යුතුය. අන් අයට වතාවත් කිරීම ද තමන් වතාවත් කරවා ගැනීම ද ගුරුවරයා විමසා අවසර ලබාගෙන ම කළයුතුය.



02 OCT 2015

ගුරුවරයා නොවිමසා ගමට හෝ වෙනත් තැනකට යාම පිණිස ආරාමයෙන් පිටවීම ද නොකළ යුතුය. මේ වත් මඟින් ශිෂ්‍යයාගේ ආත්ම ගෞරවයට හා ආරක්ෂාවට ලබා දී ඇති අගය සුළු නොවන බව පෙනේ. විශේෂයෙන් විවිධ වයස් සීමාවලට අයත් භික්ෂූන් වැඩසිටින ආරාමයක වාසය කරන විට මෙවැනි වත් අනුගමනය කිරීම ඉහතින් දැක්වූ අරමුණු සපුරා ගැනීමට ඉතාම වැදගත් වේ.

යම්හෙයකින් ගුරුවරයා රෝගී වී නම් ශිෂ්‍යයා ජීවිත කාලය පුරාම ගුරුවරයාට අවශ්‍ය උපස්ථාන කළයුතුය. එමෙන් ම ගුරුවරයා සුවපත් කරගැනීමට උත්සාහ කළයුතුය. ශිෂ්‍යයා රෝගී වූ විට ගුරුවරයා ක්‍රියා කළයුත්තේ ද සිතිය යුත්තේ ද එලෙසිනි. මෙයින් ප්‍රකට වන්නේ යථෝක්ත වත් මඟින් ශක්තිමත් වන ශාසනික ගුරු-සිසු සබඳතාව පෞද්ගලික ජීවිත අවශ්‍යතාවන් මෙන් ම ආධ්‍යාත්මික අරමුණු ද නොඅඩුව සාක්ෂාත් කරදීමට සමත් වන බවයි.

(මෙම ලිපිය මල්වතු මහාවිහාර පාර්ශවයේ අතිගරු අනුනායක පදවි ප්‍රාප්තය වෙනුවෙන් එළිදක්වන ලැබූ ප්‍රණාම උපහාර සමරුකළාපයේ පළකරන ලද ලිපියකි.)

---

**අන්තික සටහන්:**

1 "න මෙ ආචරියො අත්ථි සදිසො මෙ න විජ්ජති." මහාවග්ගපාළි I. (1957) බුද්ධ ජයන්ති ත්‍රිපිටක මුද්‍රණය (බු.ජ.ත්‍රි). ලංකාණ්ඩුවේ මුද්‍රණය. කොළඹ. 16 පිටුව.

2 "ඉක්බිත්තෙන් නොයෙක් ගුණ සමූහ නමැති ආභරණයෙන් සරහුණාවූ සර්වඥයන් වහන්සේ ... ඒකාන්තයෙන් මාවිසින් මේ මහා බෝධිද්‍රැමය සමීපයේ දී සර්වඥතා ඥානය ප්‍රතිවේද කරන ලදැයි කියා ... නොහෙළන ලද ඇසි පිය ඇති ප්‍රේමයෙන් හරිතවූ නේත්‍ර යුගලයෙන් පූජා කෙරෙමින් ... " සිංහල බෝධිවංසය. (1970). (සංස්.) සේනාධීර, ගුණපාල. අතුල මුද්‍රණාලය. කොළඹ. 82 පිටුව.

3 "අහංහි අරහා ලොකෙ අහං සත්ථා අනුත්තරො" මහාවග්ගපාළි I. 16 පිටුව.

4 චුල්ලවග්ගපාළි II. (1983) බු.ජ.ත්‍රි. 376-410 පිටු.

5 මහාවග්ගපාළි I. 92-154 පිටු.

6 - එම - 94 පිටුව හා 132 පිටුව.

7 පැවිදි නොකළයුතු පුද්ගලයන් පිළිබඳ ශික්ෂා බලන්න. මහාවග්ගපාළි I. 226 පිටුව.

8 "උපජ්ඣායො භික්ඛවේ සද්ධිවිහාරිකම්හි පුත්තචිත්තං උපට්ඨපෙස්සති. සද්ධිවිහාරිකො උපජ්ඣායම්හි පිතු චිත්තං උපට්ඨපෙස්සති" මහාවග්ගපාළි I. 94 හා 132 පිටු.

9 - එම - 94 පිටුව.



---

10 Davids, Rhys TW. (1997 Re-print). Pali-English Dictionary. Pali Text Society. Motilal Banarsidass Publishers Pvt. Ltd. Delhi. p. 141.

11 මහාවග්ගපාළි I. 132 පිටුව.

12 Davids, Rhys TW. (1997 Re-print). p. 96.

13 "අනුජානාමි භික්ඛවෙ බ්‍යත්තේන භික්ඛුනා පටිබලෙන හ එකෙන ද්වෙ සාමණෙරෙ උපට්ඨාපෙතුං."

14 සිගාලෝවාද සුත්ත. දීඝනිකාය III. (1976) බු.ජ.ත්‍රි. 304 පිටුව.

15 වත්තක්ඛන්ධකයේ දැක්වෙන මේ ගුරු-සිසු වත් භික්ෂුව විසින් කවර අවස්ථාවේ දී අනුගමනය කළයුතු ද යන්න මුලින් ම නිරාකරණය කරගත යුතුව ඇත. ඊට හේතුව නම් කුල දරුවෙක් සාමණේර පැවිද්ද ලබන අවස්ථාවේ දී මෙන් ම සාමණේර නමක් උපසම්පදාව ලබන අවස්ථාවේ දී ද උපාධ්‍යායන් වහන්සේ නමක් හා ආචාර්යන් වහන්සේ නමක් පත්කර ගැනීමට අනුදැන තිබීමයි.[15] ඇත්ත වශයෙන් ම මෙයින් ප්‍රකට වන වැදගත් ම කාරණය නම් සංඝ සමාජය සාමණේර හා උපසම්පන්න යනුවෙන් කොටස් දෙකකට බෙදා දක්වන විට දී පවා උපාධ්‍යාය හා සද්ධිවිහාරක, ආචාර්ය හා අන්තේවාසික යන සමාජ ස්තර හතර ප්‍රකටව දක්නට ලැබීමයි. මෙයින් උපාධ්‍යාය හා ආචාර්ය යන දෙපිරිස ගුරුවරුන්ගේ සංඛ්‍යාවටත් සද්ධිවිහාරික හා අන්තේවාසික යන දෙපිරිස ශිෂ්‍ය ගණයටත් අයත්වේ. එබැවින් සංඝ සමාජය මේ ස්තර හතර අනුව ගුරු ශිෂ්‍ය වශයෙන් ඉතා පැහැදිලිව කොටස් දෙකකට වෙන්කළ හැකිය. ඒ අනුව සංඝ සමාජයේ ක්‍රියාත්මක වන ගුරු-ශිෂ්‍ය නම්වූ ආචාරාත්මක රාමුව තුළ පිහිටා ඉතාමත් පහසුවෙන් තීරණ ගැනීමට හා ඒවා ක්‍රියාත්මක කිරීමට හැකියාව ඇති බව ද පැහැදිලිය.

16 වත්තක්ඛන්ධකයේ දැක්වෙන මේ ගුරු-සිසු වත් භික්ෂුව විසින් කවර අවස්ථාවේ දී අනුගමනය කළයුතු ද යන්න මුලින් ම නිරාකරණය කරගත යුතුව ඇත. ඊට හේතුව නම් කුල දරුවෙක් සාමණේර පැවිද්ද ලබන අවස්ථාවේ දී මෙන් ම සාමණේර නමක් උපසම්පදාව ලබන අවස්ථාවේ දී ද උපාධ්‍යායන් වහන්සේ නමක් හා ආචාර්යන් වහන්සේ නමක් පත්කර ගැනීමට අනුදැන තිබීමයි.[16] ඇත්ත වශයෙන් ම මෙයින් ප්‍රකට වන වැදගත් ම කාරණය නම් සංඝ සමාජය සාමණේර හා උපසම්පන්න යනුවෙන් කොටස් දෙකකට බෙදා දක්වන විට දී පවා උපාධ්‍යාය හා සද්ධිවිහාරක, ආචාර්ය හා අන්තේවාසික යන සමාජ ස්තර හතර ප්‍රකටව දක්නට ලැබීමයි. මෙයින් උපාධ්‍යාය හා ආචාර්ය යන දෙපිරිස ගුරුවරුන්ගේ සංඛ්‍යාවටත් සද්ධිවිහාරික හා අන්තේවාසික යන දෙපිරිස ශිෂ්‍ය ගණයටත් අයත්වේ. එබැවින් සංඝ සමාජය මේ ස්තර හතර අනුව ගුරු ශිෂ්‍ය වශයෙන් ඉතා පැහැදිලිව කොටස් දෙකකට වෙන්කළ හැකිය. ඒ අනුව සංඝ

සමාජයේ ක්‍රියාත්මක වන ගුරු-ශිෂ්‍ය නම්වූ ආචාරාත්මක රාමුව තුළ පිහිටා ඉතාමත් පහසුවෙන් තීරණ ගැනීමට හා ඒවා ක්‍රියාත්මක කිරීමට හැකියාව ඇති බව ද පැහැදිලිය.

17 වත්තක්ඛන්ධකයේ දක්වෙන මෙ ගුරු-සිසු වත් භික්ෂුව විසින් කවර අවස්ථාවේ දී අනුගමනය කළයුතු ද යන්න මුලින් ම නිරාකරණය කරගත යුතුව ඇත. ඊට හේතුව නම් කුල දරුවෙක් සාමණේර පැවිද්ද ලබන අවස්ථාවේ දී මෙන් ම සාමණේර නමක් උපසම්පදාව ලබන අවස්ථාවේ දී ද උපාධ්‍යායන් වහන්සේ නමක් හා ආචාර්යන් වහන්සේ නමක් පත්කර ගැනීමට අනුදැන තිබීමයි.[17] ඇත්ත වශයෙන් ම මෙයින් ප්‍රකට වන වැදගත් ම කාරණය නම් සංඝ සමාජය සාමණේර හා උපසම්පන්න යනුවෙන් කොටස් දෙකකට බෙදා දක්වන විට දී පවා උපාධ්‍යාය හා සද්ධිවිහාරක, ආචාර්ය හා අන්තේවාසික යන සමාජ ස්තර හතර ප්‍රකටව දක්නට ලැබීමයි. මෙයින් උපාධ්‍යාය හා ආචාර්ය යන දෙපිරිස ගුරුවරුන්ගේ සංඛ්‍යාවටත් සද්ධිවිහාරික හා අන්තේවාසික යන දෙපිරිස ශිෂ්‍ය ගණයටත් අයත්වේ. එබැවින් සංඝ සමාජය මෙ ස්තර හතර අනුව ගුරු ශිෂ්‍ය වශයෙන් ඉතා පැහැදිලිව කොටස් දෙකකට වෙන්කළ හැකිය. ඒ අනුව සංඝ සමාජයේ ක්‍රියාත්මක වන ගුරු-ශිෂ්‍ය නම්වූ ආචාරාත්මක රාමුව තුළ පිහිටා ඉතාමත් පහසුවෙන් තීරණ ගැනීමට හා ඒවා ක්‍රියාත්මක කිරීමට හැකියාව ඇති බව ද පැහැදිලිය.

18 චුල්ලවග්ගපාළි II. 388 පිටුව.

19 "ආචරියම්හි අධිමත්තං පෙමං හොති, අධිමත්තෝ පසාදො හොති, අධිමත්තෝ හිරි හොති, අධිමත්තෝ ගාරවො හොති, අධිමත්තා භාවනා හොති."

20 චුල්ලවග්ගපාළි II. 376-410 පිටු.

21 සචෙ උස්සහති-ඉදින් හැකියාවක් තිබේ නම් කළයුතු බව කියැවේ. චූ.ව. 2. 380 පිටුව.

22 ම.නි.අ. II කාණ්ඩය. (1943) හේවාවිතාරණ සංස්කරණය. කොළඹ. 75. පිටුව.

23 නහානොදකං දුල්ලභං - එම -

24 අයං විහාරො අච්චන්ත සංඝිකො, එකං පුග්ගලිකට්ඨානං කරොහීති. - එම -

25 දුක්ඛෙන තෙ සාමණෙර කතං, අජ්ජ තාව ත්වං යෙව වසාහීති. - එම -